# බළන්ගොඩ නගර සභාව

## 2018-07-12 දින මහ සභා වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2018.07.12**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ර්. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. ප්‍රේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ප්‍රධාන කළමණාකරන සහකාර | ජී.ඩී. අරුණි සේමපාළ මිය |

**01. පසුගිය සභාවේ සභා වාර්තාව සම්මත කිරීම**

සභාපතිතුමා විසින් සභාවට දැනුම්දුන් අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් 2018.06.14 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් එය ස්ථිර කරන ලදුව පසුගිය සභාවේ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. ප්‍රේමදාස මැතිතුමන් විසින් සභා වාර්තාවක් යෝජනා ස්ථිර කර සභා සම්මත කරගත් පසු සංශෝධන ඉදිරිපත් කල හැකිද යන්න විමසා සිටි අතර, සංශෝධන ඉදිරිපත් කල පසු වාර්තාව සභා සම්මත කර ගැනීම වඩාත් සුදුසු බව පවසා සිටින ලදී.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් සියළු සභා කටයුතු සිදුකෙරෙන්නේ සභා රීතිවලට අනුකූලව බවත්, සංශෝධනයන්ට යටත්ව වාර්තාව සභා සම්මත කරගන්නා බැවින් ඒ සම්බන්ධව ගැටළුවක් ඇතිකර නොගන්නා ලෙසත් පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් අදහස් දක්වමින් සභාවේ ගරු සභිකයන් සඳහා අසුන් පනවන විට සභිකයන් ප්‍රමුඛතාගත පිළිවෙළට නොව එක් එක් පක්ෂයේ සාමාජිකයන් පිළිවෙල අනුව අසුන්ගත කරන ලෙස පවසා සිටි අතර ,ඕනෑම අවස්ථාවක පළාත් පාලන සංසදය ගෙන්වා සභා කටයුතු පිළිබඳව නොමිළේ පුහුණුවක් ලබාදීමට සූදානම් බව පවසා සිටින ලදී.

**02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන**

ගරු සභාපති චමික ජයමිණි විමළසේන මැතිතුමන් විසින් අදහස් දක්වමින් දේශපාලනඥයන් හා ජනතා සේවකයන් ලෙස ක්‍රියාකරන විට තරාතිරම, පුද්ගලයන් නොබලා එම පුද්ගලයන්ගේ ක්‍රියාකළාපය හා එහි වැදගත් භාවය අනුව කටයුතු කල යුතු බවත් පටු දේශපාලන වාසි නොතකා සභාව හා ආයතනය විවේචනය වන පරිදි අදහස් ප්‍රකාශ කිරීම නොකල යුතු බවත් මෙහිදී පවසා සිටින ලදී.

**03. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම**

*03:01* සභාවට එවන ලද පෙත්සමක් ගරු සභාවට ඉදිරිපත් කල ගරු සභාපතිතුමා සේනක පෙදෙසේ හා නගරයේ වැසියන් විසින් බලංගොඩ නගරයට පිවිසුම් ස්ථානයේ පවතින ඔරලෝසු කණුව ඉදිරිපිට ඇති ගරාජය නිසා සිදුවන පරිසර හානිය පිළිබඳව සකස් කරන ලද පෙත්සමේ පිටපතක් ලැබී ඇති බවත් ඒ ස්ථානයේ භාවිතා කරන කාබයිඩ් නිසා එම ප්‍රදේශයේ ජීවත්වන පුද්ගලයින්ගේ ශ්වසන ක්‍රියාවලියට ඉතාම අසහනකාරි බව සඳහන් කර ඇති බවත් පවසා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් අදහස් දක්වමින් මෙම පෙත්සමේ පිටපතක් තමන් වෙතද ලැබී ඇති බවත්, මේ සම්බන්ධයෙන් තොරතුරු සොයා බැලීමේදි මෙම ගරාජය සඳහා පරිසර බලපත්‍රයක් ලැබී ඇති බවත් පවසා සිටින ලදී.ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් මේ පිළිබද මහජන සෞඛ්‍යය පරීක්ෂකවරයා යොදවා නිරීක්ෂණය කොට ඉදිරි පියවරක් ගැනීම සුදුසු බවට ප්‍රකාශ කල අවස්ථාවේ ගරු සභාවේ සභිකයන් විසින් එය අනුමත කරන ලදී.

*03:02* හදිසි යෝජනාවක් ලෙස ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ශ්‍රී සුදර්ශනගම සංවර්ධන සමිතියට බටනල ලබාදීම සම්බන්ධව ගරු සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහීදි අදහස් පල කර ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය ශ්‍රී සුදර්ශනගම සංවර්ධන සමිතියට මගින් සිදුකරන ප්‍රජානළ ව්‍යාපෘතියට අවශ්‍ය බටනල තම පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන ඔස්සේ ලබාදෙන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී. මෙම යෝජනාව ගරු සභාවේ හදිසි යෝජනා යටතේ ඒකමතිකව සම්මත විය.

## 04. කල් දී ඇති යෝජනා

### *04:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා*

04:01:01 බැංකියවත්ත ආරක්ෂක බැම්මේ ඉතිරි කොටස සභාව මගින් ඉටුකිරීම.

බැංකියවත්ත ආරක්ෂක බැම්මේ ඉතිරි කොටස නගර සභාව මගින් ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් ප්‍රකාශ කරන ලද ගරු සභාපතිතුමා බැංකියවත්ත ආරක්ෂක බැම්මේ ඉදිකිරීම් කටයුතු ඉතාමත්ව මන්දගාමීව සිදුවන බව නිරීක්ෂණය වන බවත් 2017 වර්ෂයේ හිටපු මහ ඇමති නියෝගය මත දනට ඩෙක්මා ආයතනයෙන් අදාළ කොන්ත්‍රාත්තුව භාරගෙන ක්‍රියාකලද අදාළ ඉදිකිරීම් ඉතා මන්දගාමී ලෙස සිදුකරමින් පවතින බවත් ප්‍රකාශ කල අතර මේ පිළිබද නිරන්තරයෙන් අදාළ ආයතනය දනුවත් කලද ඊට යහපත් ප්‍රතිචාරයක් නොලැබුනු හෙයින් හා මේ වන විට මෙහි ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කල ඇති බැවින් හා මෙම කටයුතු කඩිනමින් ඉටුකර ගැනීමේ අවශ්‍යතාවය මත ඝන අපද්‍රව්‍යය කළමණාකරන මධ්‍යස්ථානයේ ඉදිරි සංවර්ධන කටයුතු කල යුතු නිසා මෙම යෝජනාව කරන ලද බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා මේ සඳහා වැය වන වියදම පිළිබඳ කරුණු විමසා සිටින ලදුව ගරු සභාපතිතුමන් විසින් පිළිතුරු සපයමින් මේ සඳහා එවකට මහ ඇමති නියෝගය මත සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහා එක් කෝටි එකොලොස් ලක්ෂයට ආසන්න මුදලක් වැය වන බව පවසා සිටින ලදී.

මෙහිදි ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් අදහස් දක්වමින් මෙහි ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ලබා දීමේදි ගිවිසුම් සකස් කර 10% ඇප තැන්පතු ලබා ගැනීමක් සිදුකලාද යන්න විමසා සිටි අවස්ථාවේ ගරු සභාපතිතුමා විසින් පිළිතුරු ලබාදෙමින් එවකට එසේ කිසිවක් සිදුකල නොමැති අතර මහ ඇමති නියෝගය අනුව ක්‍රියාකර ඇති බවත් පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමන් විසින් ඉහතින් ගෙනා යෝජනාව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:02 බස් නැවතුම්පළ පරිශ්‍රයේ බුලත් විට වෙළදාම හා බුළත් කෙළ ගැසීම තහනම් කිරීම**

බුළත් කෙළ ගැසීම නිසා නගරයේ දිනෙන් දින වර්ධනය වන අපිරිසිදු තත්වය වැළැක්වීමේ අටියෙන් හා පරිසර පොලිසියේ ද සහයෝගය ඇතිව යම් යම් ක්‍රියාමාර්ග ගත්තද කිසිදු වෙනසක් දක්නට නොමැති හෙයින් විශාල පිරිවැයක් දරා ඉදිකරන ලද බස් නැවතුම්පළ පරිශ්‍රයේ බුලත් විට වෙළදාම හා බුළත් කෙළ ගැසීම තහනම් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමන් විසින් අදහස් දක්වමින් මෙම අදහස නගරයේ පිරිසිදු කම වෙනුවෙන් හිතකර වුවද, ඈත අතීතයේ සිට සම්ප්‍රදායක්ව පැවත එන බුළත් අප බොහොමයක් ජීවිත හා බද්ධ වී පවතින බවත් බුළත් විට වෙළෙදාමෙන් පමණක් ජීවත්වන මිනිසුන් විශාල පිරිසක් සිටින බැවින් මෙය ඔවුනට සිදුකරන අසාධාරණයක් වන බවත් එම නිසා බුළත්විට කන පුද්ගලයන් සඳහා නගරයේ වෙනම ස්ථානයක් නිර්මාණය කරදීම සුදුසු බවත් පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් අදහස් දක්වමින් දේශිය කෑමක් වන බුළත් විකුණා ජීවත්වන විශාල පිරිසක් මෙන්ම බුළත් විට ආහාරයට ගන්නා විශාල පිරිසක් සිටින බැවින් බුළත් විට වෙළදාම තහනම් නොකර අදාළ වෙළදුන්ට නගරයේ පිරිසිදු බව සඳහා අවැසි උපදෙස් ලබාදෙන ලෙසත් මෙම බස් නැවතුම්පළ පරිශ්‍රයේ බුලත් විට වෙළදාම හා බුළත් කෙළ ගැසීම තහනම් කිරීම පිළිබඳ විරුද්ධ වෙන බවත් පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් අදහස් දක්වමින් නගරයේ පිරිසිදු කම වෙනුවෙන් බුළත් කෙළ ගැසීම නතර විය යුතු වුවද බුළත් විට වෙළදාම නතර නොකර බුළත් විට අලෙවිකරුවන් දැනුවත්කිරීම කලයුතු බවත් ඔවුනට යම් උපදෙස් මාලාවක් ලබාදීමටත් , බුලත් කෙළ බැහැර කිරීම සඳහා බැරල් තැබීම වැනි විකල්ප ක්‍රම හදුන්වා දිය යුතු බවත් පවසා සිටි ගරු මන්ත්‍රීතුමන් විසින් විකල්ප ක්‍රමවේද ඔස්සේ මෙම තත්වය පාලනය කිරීමටත්, මහජන සෞඛ්‍යය පරීක්ෂක යොදවා අධීක්ෂන කටයුතු සිදු කිරීම සුදුසු බවත් පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමන් විසින් අදහස් දක්වමින් බුළත් විට කන පුද්ගලයන්ම නොව විකුණන පුද්ගලයන්ද තදින් දැනුවත් කල යුතු බවත්, කෙළ ගැසීම තහනම් ලෙස සඳහන් බෝඩ්වලට පවා කෙළ ගසාගෙන යන සමාජයක ආකල්ප වෙනසක් විය යුතුම බවත් පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ.ප්‍රේමකුමාර මැතිතුමන් විසින් අදහස් ප්‍රකාශ කරමින් විශාල පිරිසක් ජීවනෝපාය සරිකර ගන්නා බුළත් විට වෙළදාම තහනම් නොකරන

ලෙසත්, බුලත් විට වෙළඳුන් හා ත්‍රීවිල් රියදුරන් දැනුවත් කර බුලත් කෙල ගැසීම නතර කිරීමේ ක්‍රම වේදයකට යෑම සුදුසු බවත් මෙහිදී පෙන්වා දෙන ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් අදහස් දක්වමින් සියළු දෙනාට පොදුවේ එක් දෙයක් කල යුතු බවත් බුලත් විට වෙළඳුන්ගෙන් සභාවට යම් ගාස්තුවක් අයකර ගන්නා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කලහොත් ආකල්ප වෙනසක් තුළින් යම් ප්‍රගතියක් සිදුකර ගැනීමට හැකිවන බව ගරු සභාවට පෙන්වා දෙන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා අදහස් දක්වමින් බුලත් විට වෙළඳුන්ගෙන් ගාස්තු අයකිරීමට සම්පූර්ණයෙන් විරුද්ධ බවත් නගරයේ ඇති කඩ විශාල ප්‍රමාණයක බුලත් විට අලෙවි වීම සිදුවන බවත් සිදු විය යුත්තේ ආකල්ප වෙනසක් විනා නීතිරීති පැනවීමක් නොවන බවත් ප්‍රකාශ කල අතර, අත්පත්‍රිකා බෙදා දීමෙන් නගරය දැනුවත් කිරීමක් සිදුකල යුතු බවත් පවසා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් අදහස් දක්වමින් වෙළඳ සැලක් පාසා ගොස් දැනුවත් කිරීමට වඩා පරිසර පොලිසියේ සහය ලබාගෙන දවසට දෙතුන් වතාවක් නිරීක්ෂණ චාරිකාවක් ක්‍රියාවට නැංවීම වඩාත් ඵලදායි බව ගරු සභාවට පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් බුලත් විට වෙළඳුන්ගෙන් ගාස්තු අයකිරීම සම්බන්ධව තමන්ද විරුද්ධ බවත්, සිදුවිය යුත්තේ අකල්ප වෙනසක් තුළින් යම් විනයක් ඇති කර යම් පාලනයක් ඇති කිරීම බවත් පවසා සිටින ලදී.

වර්තමානයේ පවතින තත්වය අනුව රටට ගැලපෙන විකල්පයක් ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමන් විසින් ඉදිරිපත් කල බවත් ආකල්ප වෙනස් කිරීම අත්‍යවශ්‍ය වුවද ගාස්තු පැනවීම ගැටළුකාරි විය හැකි බැවින් බුලත් විට අලෙවිහිමියන් දැනුවත් කිරීම, බුලත් කෙළ ගැසීම සඳහා බැරල් ස්ථානගත කරන ලෙස අදාළ අලෙවිකරුවන් දැනුවත් කිරීම තුළින් ආකල්ප වෙනසකට යොමුකිරීම සිදුකර බැලීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:03 කාර්පාක් ගොඩනැගිල්ල මහල් 2න් සකස් කිරීම.**

කාර්පාක් ගොඩනැගිල්ල මහල් 2න් සකස් කිරීම සඳහා ගරු සභාපතිතුමා ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු සභාපතිතුමා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබෙන ප්‍රතිපාදන බලංගොඩ පොදු වෙළෙද සැල ඉදිකිරීම සඳහා යොමුකලද ගරු ඇමතිනි තළතා අතුකෝරාල මැතිතුමිය ඒ සඳහා ප්‍රතිපාදන ලබාදීමට නියමිත බැවින් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබෙන මිලියන 25 ක ප්‍රතිපාදන තුළින් පොදු වෙළෙද සැල වෙනුවට කාර්පාක් ගොඩනැගිල්ල මහල් 2න් සකස් කිරීමට තීරණය කල බව ප්‍රකාශ කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් එය ඉතා යහපත් යෝජනාවක් බවත් බොහෝ කාලයක් සිට මෙම ස්ථානයේ වෙළදාම් කරන වෙළඳුන්ට මෙම ඉදිකිරීම්වලින් පසු කිසිදු අසාධාරණයක් නොවන පරිදි ක්‍රියා කරන මෙන් ඉල්ලා සිටින බවත් පවසන ලදී.එමෙන්ම මේ සම්බන්ධ සාකච්ඡාවලදී සියළු මන්ත්‍රීවරුන් කැඳවන මෙන්ද වැඩි දුරටත් ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් ඉල්ලා සිටින ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් අදහස් දක්වමින් දැනට සිටින වෙළඳුන් ප්‍රමුඛතාගත කොට ඔවුනට පළමුව ලබාදීම සුදුසු බවත්, උසාවිය අසළ බැවින් එම ස්ථානය නීතිඥ්‍ය කාර්යාල සඳහාද උචිත වන බවත් පවසා සිටින ලදී. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම ඉදිකිරීම් අවසන් වන තෙක් විකල්ප ස්ථානයක් ඒ සඳහා ලබාදීමට සිදු වේ දැයි අසන ලද පැනයට පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් ඉදිකිරීම් ආරම්භ කල පසු කඩිනමින් අවසන් කිරීමට අපේක්ෂා කරන බැවින් එවන්නක් අවශ්‍ය නොවෙන බව පවසා සියින ලදී.

ගරු සභාපතිතුමන් විසින් ඉහතින් ගෙනා යෝජනාව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:04 බැංකියවත්ත ගම්වාසීන්ට එරෙහිව නගර සභාව විසින් ගොණු කරන ලද නඩු ඉවත්කර ගැනීම.**

බැංකියවත්ත ගම්වාසීන්ට එරෙහිව නගර සභාව විසින් ගොණු කරන ලද නඩු ඉවත්කර ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් වැඩි දුරටත් අදහස් දක්වමින් බැංකියවත්ත ගම්වාසීන්ට එරෙහිව නගර සභාව විසින් ගොණු කරන ලද නඩු අංක බී/882/16 හා 61721 යන නඩු එම ගම්වාසීන්ගේ ඉල්ලීම මත හා නැවත නගර සභා සේවකයෙකුට හෝ සභාවේ රාජකාරි සඳහා අවහිරතාවයක් නොකරන බවට ඔවුන් ගෙන් දිවුරුම් ප්‍රකාශ ලබාගත් පසු , දෙපාර්ශවයේ එකඟතාවය මත මෙම නඩු ඉවත්කර ගැනීමට සුදුසු බව පවසා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා තමන් විසින් මෙම යෝජනාව පෙර සභාවාරයකදී ඉදිරිපත් කලද එය ඉටුකිරීමට නොහැකි බව පවසා සිටි බවත් දැන් එය ඉවත්කර ගැනීම සඳහා යම් බලපෑමක් සිදුවූවාද යන්නත් විමසා සිටි අතරම සද්භාවයෙන් මෙය ඉවත්කර ගැනීම පිළිබද සතුටු වන බවද පවසා සිටින ලදී.

මේ සඳහා ගරු සභාපතිතුමන් විසින් පිළිතුරු ලබා දෙමින් අදාල ගම්වාසීන් විසින් මේ සඳහා ඉල්ලීමක් කර ලිපියක් ඉදිරිපත් කල බවත්, මේ සඳහා අවශ්‍ය නීතිමය උපදෙස් ලබාගත් හෙයින් අදාළ නඩු ඉවත් කර ගැනීම සුදුසු බවට තීරණය කරගත් බවත් පවසා සිටින ලදී. සභාවේ විරෝධතාවයක් නොවූ හෙයින් ගරු සභාපතිතුමන් විසින් ඉහතින් ගෙනා යෝජනාව ඒකමතිකව සම්මත විය.

**04:01:05 තුරු උයන සඳහා අළෙවිසැලක් හා වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම.**

තුරු උයන සඳහා අළෙවිසැලක් හා වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

වැඩි දුරටත් අදහස් ප්‍රකාශ කල ගරු සභාපතිතුමන් විසින් තුරු උයන පරිශ්‍රය ඉතා අසතුටුදායක තත්වයක පවතින බැවින් එම ස්ථානය දියුණු කර ගැනීමට හා එහි නගර සභාව මගින් ආදායම් උත්පාදක ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන බැවින් එහි මූලික පියවර ලෙස අළෙවිසැලක් හා වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සුදුසු බව පවසා සිටින ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් අදහස් දක්වමින් තුරු උයන සහිත ඉඩම අයාලේ යන ඉඩමක් බව සිතමින් බොහෝ පිරිස් කැඩිච්ච වාහන ගාල් කර තැබීමටත්,ගල් වැනි ඉදිකිරීම් ද්‍රව්‍යය ගබඩා කර තැබීමටත් හුරු වී ඇති බැවින්, සුදුසු පරිදි කඩිනමින් සංවර්ධන කටයුතු සිදු කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙහිදී ස්ථානීය පරීක්ෂණයක් සිදුකර හොඳ සැළසුමකට අනුව අධීක්ෂණයකින් යුතුව ඉදිකිරීම් සිදුකරන ලෙසත් එහිදී එම අළෙවි සැලේ දේශීය ද්‍රව්‍යය අළෙවි කිරීමටත් ,ඇවිදින අය සඳහා ඇඳුම් මාරු කරන කාමරයක් ඉදිකිරීම වැනි දෑ ඉතා සාර්ථක ආදායම් ව්‍යාපෘතියක් වනු ඇතැයි පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් පිළිකන්නක් නැති ගොඩනැගිල්ලක් ඉදිකිරීම සුදුසු බවත් මෙහි දුම් බීමට ස්ථානයක් වෙන්කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් ඉහතින් ගෙනා යෝජනාව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04፥01፥06 පුස්තකාල පාඨකයින් සඳහා ආහාර ගැනීමට ස්ථානයක් සකස් කිරීම**

පුස්තකාල පාඨකයින් සඳහා ආහාර ගැනීමට ස්ථානයක් සකස් කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අ.පො.ස උ/පෙළ විභාගයට පෙනී සිටින පාඨකයින් පුස්තකාලය විවෘත කරන අවස්ථාවේ සිට වසන අවස්ථාව තෙක් පුස්තකාලයේ රැඳී සිටින අතර ඔවුනට දිවා ආහාරය ගැනීමට නිශ්චිත ස්ථානයක් ස්ථාපනය කර නැති බැවින් දූනට ළමා උද්‍යානයේ බංකුවල සිට ආහාර ගන්නා අතර වැසි දිනවලදී එය සිදු කිරීමට අපහසු බැවින් පුස්තකාල පාඨකයින් සඳහා ආහාර ගැනීමට ස්ථානයක් සකස් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් මෙහිදී පවසා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් හා එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් අදහස් දක්වමින් මේ සඳහා ආහාර ගැනීමට විවෘත ස්ථානයක් ඉදිකර දීම සුදුසු බව පවසා සිටින ලදී.

සභාවේ විරෝධතාවයක් නොවූ හෙයින් ගරු සභාපතිතුමන් විසින් ඉහතින් ගෙනා යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04፥01፥07 රජයේ මුදල් යොදා කරනු ලබන ව්‍යාපෘතිවලදී හා දීර්ඝ කාලයක් ජල හිඟයෙන් වෙලී සිට ජල සම්පත් මණ්ඩලයෙන් සිදු නොකරන ලද හා ප්‍රජා සමිති මගින් ඉල්ලුම් කරන ලද ජල ව්‍යාපෘති සඳහා මාර්ග උරහිස පළුදු කිරීමට නගර සභාවේ අධීක්ෂණය මත හා නැවත සකස් කර දීමේ එකගතාවය මත, අයකරනු ලබන මුදල් නිදහස් කිරීම.**

රජයේ මුදල් යොදා කරනු ලබන ව්‍යාපෘතිවලදී හා දීර්ඝ කාලයක් ජල හිඟයෙන් වෙලී සිට ජල සම්පත් මණ්ඩලයෙන් සිදු නොකරන ලද හා ප්‍රජා සමිති මගින් ඉල්ලුම් කරන ලද ජල ව්‍යාපෘති සඳහා මාර්ග උරහිස පළුදු කිරීමට නගර සභාවේ අධීක්ෂණය මත හා නැවත සකස් කර දීමේ එකගතාවය මත, අයකරනු ලබන මුදල් නිදහස් කිරීම සඳහා ගරු සභාපතිතුමා ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් මෙය ඉතා කාලෝචිත මාතෘකාවක් බවත්, නගර සභා සීමාවේ ජල ව්‍යාපෘති සඳහා මාර්ග උරහිස පළුදු කිරීමේදි විශාල මුදලක් වැයවන බැවින් මේ

සම්බන්ධව ගත් තීරණයට ගරු සභාපතිතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වන බවත් පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් මේ පිළිබඳ පොදුවේ තීරණයක් ගන්නා ලෙසත් පෞද්ගලිකව ජලය ලබාගැනීමට අපේක්ෂා කරන සාමාන්‍ය ජනතාවටද මෙම තීරණය වලංගු විය යුතු බවත් පවසා සිටි අතර එසේ සිදු නොවුන හොත් ඔවුන් මුහුන පාන අපහසුතා පිළිබඳ පෙන්වා දෙන ලදී. මෙහිදී ගරු උප සභාපති එම්. ටී. එම්. රුමී මැතිතුමන් විසින් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූ අදහස සත්‍ය බවත්, අඩු ආදායම්ලාභී සහතිකය සමඟ එසේ ගාස්තු අය නොකර සිටීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් අදහස් දක්වමින් නගර සභාව මගින් මාර්ග උරහිස පළුදු කිරීම සඳහා මුදල් ලබා ගත්තද, කිසි විටෙක නඩත්තු කටයුතු සිදු නොකරන බැවින් මෙය සභාවේ වගකීමක් වන බවත්, පුද්ගලයන් මත ගාස්තු නිදහස් නොකර සැමට පොදුවේ මේ පිළිබඳ ක්‍රියා කරන ලෙස පවසා සිටින ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් මේ පිළිබඳ අදහස් දක්වමින්, ගරු මන්ත්‍රිවරුන්ට ප්‍රතිපාදන ලබාදීමේදිද වෙන්කරන්නේ ජනතා බදු මුදල් බැවින් එම සංවර්ධන කටයුතු සිදුකිරීමේදි සභාවට අයවිය යුතු මුදල් නිදහස් කරමින් එම සංවර්ධනයන් සඳහා සභාව විශාල කැප කිරීමක් සිදුකරන බව පෙන්වා දෙන ලදී

සභාවේ විරෝධතාවයක් නොවූ හෙයින් ගරු සභාපතිතුමන් විසින් ඉහතින් ගෙනා යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ01ඃ08 ජල ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදි මාර්ග පළුදු කිරීම සඳහා යන මුදල්ද ඇස්තමේන්තු කිරිම.**

ජල ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදි මාර්ග පළුදු කිරීම සඳහා යන මුදල්ද ඇස්තමේන්තු කිරිම සඳහා ගරු සභාපතිතුමා ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා ජල ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදි මාර්ග පළුදු කිරීම සඳහා යන ගාස්තු ඇස්තමේන්තුවට ඇතුළත් කරගෙන මුදල් ප්‍රතිපාදන වෙන්කර ගන්නා ලෙස ගරු සභාවට දන්වා සිටින ලදී.

සභාවේ විරෝධතාවයක් නොවූ හෙයින් ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:09 කී මනි කඩකාමර ගිවිසුම් කෙටුම්පත හා පදික කඩ අංක 185/21 කඩකාමර ගිවිසුම් කෙටුම්පත සභාගත කිරීම.**

කී මනි කඩකාමර ගිවිසුම් කෙටුම්පත හා පදික කඩ අංක 185/21 කඩකාමර ගිවිසුම් කෙටුම්පත සභාගත කිරීම සඳහා ගරු සභාපතිතුමන් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා කි මනී කඩකාමර හා පොදු වෙළෙඳ සැල් කඩකාමර සඳහා කීප වරක් කඩකුලී සංශෝධනය වූ බවත් නගරයේ ව්‍යාපාර අඩු පොදු වෙළෙද සැල් කුළිය මෙසේ වැඩිකිරීම නුසුදුසු තත්වයක් බවත්,කී මනි කඩ කාමර හා පොදු වෙළෙද සැල් කඩ කාමර කුළි වැඩි වී ම පිළිබඳ ගරු සභාවේ අවධානය යොමුකල යුතු බවත් පවසා සිටින ලදී.

එසේම ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් කීමනි ගෙවූ කඩ හිමියන්ට වැඩි තක්සේරුවකුත් කීමනි නොගෙවූ කඩ හිමියන්ට අඩු තක්සේරුවකුත් ලැබී ඇති බව අසාධරණ බව පෙන්වා දෙන ලදී.

මෙහිදී තව දුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමන් විසින් සාප්පු කඩකාමර සඳහා අයකරන ලද ගිවිසුම් ඇප තැන්පත් පිළිබඳ ලේඛනයක් හා එම කඩකාමර සඳහා දැනට අයකරන කුලිය හා තක්සේරු කුළිය අතර වෙනස සඳහන් කරන ලද ලේඛනයක් ද අවශ්‍ය බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් හා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් රත්නපුර නගර සභාවේ කඩකුලී හා සසඳා බලන කල මෙම කුළිය ඉතා විශාල කුළියක් බව පවසා සිටි අතර වැඩිදුර අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් අවම පහසුකම් යටතේ ව්‍යාපාර අඩුවෙන් සිදුවෙන පොදු වෙළෙද සැල් පරිශ්‍රයේ කඩකුලී විශාල වශයෙන් වැඩිකිරීම ඉතා අසාධාරණ තත්වයක් බවත් පවසා සිටින ලදී.

මේ සම්බන්ධව පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් අවස්ථා කීපයක සංශෝධනය වූ මෙම තක්සේරුවේ යම් යම් මිල ගණන් පිළිබඳ ගැටළු සහගත තත්වයක් පෙනෙන නමුත් , ආණ්ඩුකාරවරයාගේ හා මහ ඇමති නියෝගය අනුව පැනවූ තක්සේරුව 2018 ජූනි මස සිට ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන කොමසාරිස් විසින් දන්වා එවා තිබූ අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා 2018.06.14 දින සභාවෙන් ගත් සභා තීරණය පරිදී ක්‍රියාත්මක වීමට අපේක්ෂා කරන බව පවසා සිටින ලදී.

එමෙන්ම මේ පිළිබද වැඩිදුර සාකච්ඡාවක් පළාත් පාලන කොමසාරිස් හා සහකාර පළාත් පාලන කොමසාරිස් සහභාගි කරවාගෙන සිදු කිරීමට අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී.

මෙහිදී අදහස් ප්‍රකාශ කල ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමන් හා ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් එම සාකච්ඡාවට ව්‍යාපාරික ප්‍රජාව හා නගර සභාවේ සියළු සභිකයන් සහභාගි කර ගන්නා ලෙස බවසා සිටි අතර ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් සභා තීරණය සමග පළාත් පාලන කොමසාරිස් වෙත යවන ලද ලිපියේ පිටපතක් සෑම සභිකයෙකු වෙතම ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

කීමනි කඩකාමර ගිවිසුම් කෙටුම්පත හා පදික කඩ අංක 185/21 කඩ කාමර ගිවිසුම් කෙටුම්පත සභාගත කිරීම සඳහා ගරු සභාපතිතුමන් ගෙනා ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:10 කාර්පාක් අංක 20 ටී.සී.ජේ.සිසිල්ඩා මිය කඩ කාමරයේ බදු අයිතිය හෂාන් අනූප ප්‍රීනාත් යන නමට වෙනස් කිරීම.**

කාර්පාක් අංක 20 ටී.සී.ජේ.සිසිල්ඩා මිය කඩ කාමරයේ බදු අයිතිය හෂාන් අනූප ප්‍රීනාත් යන නමට වෙනස් කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් පෙර සභා වාරයකදී කඩකාමර බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභාවට රු. 50,000.00 අයකර ගෙන සිදු කලාක් මෙන් මේ සඳහා ද කටයුතු කිරීම සුදුසු බව පවසා සිටි අතර මේ සඳහා සභාවේ විරෝධතා නොමැති හෙයින් ඉහතින් ගෙනා යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:11 නගර සභා පුස්තකාලය සඳහා ආදේශක පුස්තකාල සහයකයෙකු බඳවා ගැනීම.**

නගර සභා පුස්තකාලය සඳහා ආදේශක පුස්තකාල සහයකයෙකු බඳවා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී නගර සභාව මගින් මේ සඳහා සභාවේ මුදල් ගෙවීමට තමා එකහෙළා විරුද්ධතාවය ප්‍රකාශ කරන බවත්, ජනතා බදු මුදලින් රජය වැටුප් ගෙවන බැවින් සුදුසුකම් මත පරීක්ෂනයක් කැඳවා ඒ සඳහා නියම සුදුස්සෙකු බඳවාගත යුතු බවත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් පවසා සිටින ලදී.එය නියමිත නීත්‍යානුකුල ක්‍රියා පටිපාටියට අනුව සිදුවිය යුතු බවත්,ආණ්ඩුකාරවරයාගේ හා පළාත් පාලන කොමසාරිස්තුමා ගේ අනුමැතිය යටතේ මෙය සිදුවිය යුතු බවත් එතුමා විසින් වැඩිදුරටත් අවධාරණය කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් අදහස් ප්‍රකාශ කරමින් මේ සඳහා බඳවා ගැනීමේ බලය ගරු සභාපතිතුමා වෙත ඇති බවත් කිසිදු විටෙක කිසිදු බඳවා ගැනීමක් හොරෙන් කිරීමට අවශ්‍ය නැති බවත් න්‍යාය පත්‍රයට ඇතුළත් කරමින් නීත්‍යානුකුල ක්‍රියා පටිපාටියට අනුව සිදුකරන බවත් පවසා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් මන්ත්‍රි වරප්‍රසාද භාවිතා කරමින් සභාවේ රැකියා අවස්ථා ලබාගැනීමට යාමෙන් සියල්ලන් අපහසුතාවයට පත්වීමේ ඉඩකඩ වැඩි බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් අදහස් දක්වමින් සභාවේ දැනට රැකියා පුරප්පාඩු පවතීද යන්නත් එසේ බඳවා ගැනීම් ක්‍රියා පටිපාටි සම්බන්ධව දැනුවත් වීමක් වී නොමැති බවත් පවසා සිටි අතර ගරු සභාපතිතුමා විසින් ලේකම්තුමිය සම්බන්ධ කර ගෙන ඒ පිළිබඳ විස්තර ලබාගන්නා ලෙස ගරු මන්ත්‍රිතුමියට උපදෙස් ලබා දෙන ලදී.

නගර සභා පුස්තකාලය සඳහා ආදේශක පුස්තකාල සහයකයෙකු බඳවා ගැනීමට ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 05. මන්ත්‍රි යෝජනා

### *05ඃ01 ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා*

05ඃ01ඃ01 දොරවෙළ මාර්ගයේ තුරු උයනේ සභාවට ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ඇතිකිරීම.

05ඃ01ඃ02 ඝන අපද්‍රව්‍යය මධ්‍යස්ථානය සඳහා විකල්ප ස්ථානයක් සෙවීම

05ඃ01ඃ03 ඝන අපද්‍රව්‍යය මධ්‍යස්ථානයෙ කුණු පිළිස්සීම සඳහා ඉන්සියුලේටර් ප්ලාන්ට් එකක් ඉදිකිරීම.

ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා තුන ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් ගරු සභාපතිතුමාගේ යෝජනාවට ප්‍රමුඛත්වය ලබා දෙමින් මින් පළමු යෝජනාව ඉල්ලා අස්කර ගන්නා බවත් , මෙහි දෙවන යෝජනාව වන ඝන අපද්‍රව්‍යය මධ්‍යස්ථානය සඳහා විකල්ප ස්ථානයක් සෙවීම යන්න දේශපාලන වාසි තකා ඉදිරිපත් කල නොවන්නක් බවත්, මෙය සභාව වෙත පැවරෙන වගකීමක් වන බවත් නගර භූමියෙන් පිට වෙනත් ස්ථානයකට ඝන අපද්‍රව්‍යය මධ්‍යස්ථානය රැගෙන යන ලෙසත් ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් මෙහිදී ඉල්ලා සිටින ලදී.

ඝන අපද්‍රව්‍යය මධ්‍යස්ථානයෙ කුණු පිළිස්සීම සඳහා ඉන්සියුලේටර් ප්ලාන්ට් එකක් ඉදිකිරීම ඉතා අත්‍යවශ්‍ය කරුණක්ව පවතින බවත්, බොහෝ වසර ගණනාවක් සිට පොහොර කිරීමට බැරි අපද්‍රව්‍යය මෙම ස්ථානයේ ගොඩගැසී බැවින් මේ සඳහා කඩිනම් විසඳුමක් ලබාදිය යුතු බවත් වැඩිදුර අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා , ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් පවසා සිටි පරිදි ඝන අපද්‍රව්‍යය මධ්‍යස්ථානය සඳහා විකල්ප ස්ථානයක් සෙවීම සිදුකල යුත්තක් වන බවත්, පෙර සිදුවූ ගැටළුකාරී අවස්ථාවේදි සහකාර කොමසාරිස්තුමා හා ලේකම්තුමිය විසින් ක්ෂේත්‍ර චාරිකාවක් සිදුකල අවස්ථාවේ ඝන අපද්‍රව්‍යය මධ්‍යස්ථානය සඳහා විකල්ප ස්ථානයක් ලබාදෙන බවට හා ඝන අපද්‍රව්‍යය මධ්‍යස්ථානයෙ කුණු පිළිස්සීම සඳහා ඉන්සියුලේටර් ප්ලාන්ට් එකක් ලබාදෙන බවට පොරොන්දු වූ බවත්, නැවත ගම්වාසීන් මේ පිළිබඳ ගැටළුවෙන් ඉන්නා බවත් මෙම කටයුතු අතපසු කිරීමෙන් නැවත විශාල ප්‍රශ්න රැසකට මුහුනපෑමට වනු ඇතැයිද පවසා සිටින ලදී.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් එවක පළාත් සභාවේ දේශපාලන බලයෙන් තම අභිමතාර්ථ මුදුන් පත් කලගත් අවස්ථාවක නිළධාරින්ට රාජකාරි නිසිපරිදි කරගැනීමට ඉඩ නොදුන් බවත්, මේ සඳහා විකල්ප ඉඩමක් ලබාදෙන ලෙස ප්‍රාදේශිය ලේකම් දැනුවත් කර ඇති බවත් ඒ සඳහා උපරිම උත්සාහය දරන බවත්, ඉන්සියුලේටර් ප්ලාන්ට් එකක් ලබාදෙන මෙන් පිළිසරු ව්‍යාපෘතිය හා සාකච්ඡා කර ඇති අතර කඩිනමින් එය ලබාගැනීමට හැකිවනු ඇතැයි පවසා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා අදහස් දක්වමින් බලංගොඩ නගරයේ කසළ ප්‍රශ්නයේදි නගරයෙන් පිටත විකල්ප ඉඩමක් සොයා ගෙන කසළ බැහැර කිරීමට තැත් කල අවස්ථාවේදී එහි ගම්වාසීන් විරුද්ධ වූ බව සිහිපත් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා ඉදිරිපත් කරන ලද එම යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05፥02 ගරු නාගරික ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය***

05፥02፥01 බලංගොඩ ගෙදර හා හුණු කුඹුර පාලම දෙපැත්තට යෙදෙන පැති බැම් දෙක සාදා ගැනීමට අවශ්‍ය වන ප්‍රතිපාදන ලබාගැනීම.

05፥02፥02 බලංගොඩ ගෙදර බුදු මැදුරට විදුලිය ලබාගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම.

ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රිනි පී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් මීට පෙර සභාවලදී හුණු කුඹුර පාලම ඉදිකිරීම සඳහා තළාද 3 ක් ප්‍රවාහනය කර ගැනීම සම්බන්ධව ඉල්ලීම් කර තිබුනද තවමත් එය ඉටු නොවූ බවද, ඡන්දය ලබා දුන් ජනතාව අපේක්ෂා කරන දෑ තවමත් ඉටු කර දීමට නොහැකි වී ඇති බවත් කඩිනම් අවධානය යොමු කර ඒවා ඉටු කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම බලංගොඩ ගෙදර බුදු මැදුරට විදුලිය ලබාගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන තම පුද්ගලික මන්ත්‍රි ප්‍රතිපාදන ඔස්සේ ලබා දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා තලාද ප්‍රවාහනය කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය නොකෙරුනහොත් නීතිමය ප්‍රශ්නයක් උද්ගත වන බැවින් පැති බැම්වල වැඩ අවසන් කල පසු එය ඉටුකර දීමට හැකි බවත්, තවමත් ඉටු නොවූ කර්මාන්ත පිළිබඳ සභාවේ කර්මාන්ත අංශය සම්බන්ධ කරගෙන එම කටයුතු සම්බන්ධව දැනුවත් කර අවශ්‍ය උපදෙස් ලබාදෙන ලෙසත් පවසා සිටි අතර, යෝජනා ලබාදීමේදී අවශ්‍යතා ප්‍රමුඛගත කර යෝජනා ලබාදීමට කටයුතු කරන ලෙස දැනුවත් කරන ලද අතර ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:03 ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා***

05:03:01 නිවාස ආධාර ලබාදීම

ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් නිවාස ආධාර ලබාදීම සඳහා ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රි කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මාර්ග 10 ක් අතරින් එක් මාර්ගයක් සංවර්ධනය කල විටෙක අනෙක් මාර්ගවල ජනතාව හිත් අමනාපකම් ඇති කර ගන්නා බැවින් සැමට පොදුවේ වටිනා සේවයක් සිදු කිරීම පිණිස තෝරා ගත් අඩු ආදායම් ලාභීන් සඳහා පුද්ගලික මන්ත්‍රි ප්‍රතිපාදන යොදවා නිවාස ආධාර ලබාදීමට අපේක්ෂා කල බව ගරු උප සභාපතිතුමා විසින් පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමා විසින් නිවාස ආධාර ලබාදීමට අවශ්‍ය අඩු ආදායම් ලාභී නම් ලයිස්තුව ලබා දෙන ලෙස මෙහිදී පවසා සිටි අතර ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා තම මන්ත්‍රි ප්‍රතිපාදන රු.400,000.00 මුදල නිවාස ආධාර ලබාදීම සඳහා ලබා දෙන ලෙස පෙරදී ඉල්ලීම් කලද තවමත් එය ඉටුනොවන බව පවසා සිටි අතර ඒ පිළිබඳ කනගාටුව

ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවත් තමා හට ඡන්දය අවස්ථාවේ සහයෝගය ලබාදුන් ජනතාව සඳහා මෙය ලබාදීමට අවශ්‍ය බවත් පවසා සිටින ලදී. මෙහිදී ගරු සභාපතිතුමා විසින් අදහස් දක්වමින් වැඩ අධිකාරී යොදවා ඒ පිළිබද සොයා බැලූ බවත් ඊට අදාළ ග්‍රාම නිළධාරි සහතික ලද පසු හැකි ඉක්මනින් ලබාදිය හැකි බවත් පවසා සිටින ලදී.

***05:04 ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමා***

05:04:01 ශ්‍රී සුදර්ශනගම සංවර්ධන සමිතිය මගින් ගමට ජලය ලබා ගැනීමේදී මාර්ගය මීටර් 90 පළුදු කිරීම සඳහා නගර සභාවට අයකරන රු.201,397.25 ක මුදල ඉවත්කර ජලය ලබාගැනීමට කටයුතු කිරීම.

ශ්‍රී සුදර්ශනගම සංවර්ධන සමිතිය මගින් ගමට ජලය ලබා ගැනීමේදී මාර්ගය මීටර් 90 පළුදු කිරීම සඳහා නගර සභාවට අයකරන රු.201,397.25 ක මුදල ඉවත්කර ජලය ලබාගැනීමට කටයුතු කිරීම සඳහා ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී *ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ගෙනා* ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:05 ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා***

05:05:01 බළන්ගොඩ ප්‍රධාන බස් නැවතුම්පොළ අසල ලංකා බැංකුව ඉදිරියේ තිබෙන කාණුවට ස්ලැබ් දමා ආරක්ෂා කිරීම.

05:05:02 බළන්ගොඩ මිරිස්වත්ත සුබයිර් අලීම් මාවතේ වතුර බැසීම සඳහා කාණු ඉදිකිරීම.

ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ගෙනා යෝජනා ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා බළන්ගොඩ ප්‍රධාන බස් නැවතුම්පොළ අසල ලංකා බැංකුව ඉදිරියේ තිබෙන කාණුවට ස්ලැබ් නොදමා ඇති කොටස නිසා ඉතාමත් අවදානම්කාරි තත්වයක් උද්ගත වී ඇති බවත් කඩිනමින් ඒ සඳහා සුදුසු පිළියමක් යෙදිය යුතු බවත් පවසා සිටින ලදී.

මේ තත්වය තහවුරු කරමින් ගරු නාගරික මන්ත්‍රි ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමා ලංකා බැංකුව ඉදිරියේ තිබෙන කාණුවට ස්ලැබ් දමා ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ අදහස් දක්වන ලදී.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා ලංකා බැංකුව වාණිජ ආයතනයක් බැවින් බැංකුවේ අනුග්‍රහය යටතේ නගර සභාවෙන් අවශ්‍ය සහය ලබාදී මහජනතාවගේ ආරක්ෂාව උදෙසා මේ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට එම බැංකුව දැනුවත් කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

එමෙන්ම බළන්ගොඩ මිරිස්වත්ත සුබයිර් අලීම් මාවතේ වතුර බැසීම සඳහා කාණු ඉදිකිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා පැහැදිලි කිරීමේදි ඊට පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා එම සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කරගන්නා ලෙස ගරු නාගරික මන්ත්‍රීවරයා දැනුවත් කරන ලදී. එහෙයින් ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් ඉහත ඉදිරිපත් කරන ලද යෝජනා සභාවේ ඒකමතිකව සම්මත විය.

### *05፡06 ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා*

05፡06፡01 බලංගොඩ කොට්ඨාශයේ ගම ඇළ අසළ ,අමරපාල මහතාගේ වෙළෙඳ සැල අසල මාර්ගය තාර දැමීම හෝ කොන්ක්‍රීට් කිරීම.

05፡06፡02 වතුකාරගොඩ සෝමරත්න මහතාගේ නිවස පාර පැති බැම්ම ඉදිකිරීම

05፡06፡03 බෝම්බුව පෙර පාසල් ගොඩනැගිල්ල තීන්ත ආලේප කර දීම.

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා බලංගොඩ කොට්ඨාශයේ ගම ඇළ අසළ ,අමරපාල මහතාගේ වෙළෙඳ සැල අසල මාර්ගය ඉතා අබලන් තත්වයක ඇති බැවින් බොහෝ දෙනෙකු එම මාර්ගය භාවිත කරන බැවින්ද එම මාර්ගය කොන්ක්‍රීට් කර දෙන මෙන් ඉල්ලා සිටි අතර වතුකාරගොඩ සෝමරත්න මහතාගේ නිවස පාර පැති බැම්ම ඛාදනයට ලක් වී ඇති බැවින් එම ස්ථානයේ අවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී. එමෙන්ම බෝම්බුව පෙර පාසලේ කුඩා දරුවන් රැසක් ඉගෙනීම සිදුකරන අතර ගොඩනැගිල්ල නොබෝ කලකින් තීන්ත ආලේප කර නොමැති බැවින් දුර්වර්ණ වී ඇති නිසා එහි තීන්ත ආලේප කර දෙන ලෙස මෙහිදී ඉල්ලා සිටින ලදී. එමෙන්ම තව දුරටත් අදහස් ප්‍රකාශ කල ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමන් විසින් අදහස් දක්වමින් බලංගොඩ ගෙස්ට් ඉන් ආයතනයේ බැම්ම පුපුරා අවදානම් තත්වයකට ඉදිරියේදි මුහුන පෑමට ඇති ඉඩකඩ වැඩි බැවින් නගර සභාවේ අදාල නිළධාරින් යොදවා නිරීක්ෂණය කොට අවශ්‍ය දැනුවත් කිරීම් සිදුකිරීම සුදුසු බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා සභාවේ ඒකමතිකව සම්මත විය.

***05ඃ07 ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා***

05ඃ07ඃ01 කොමර්ෂල් බැංකුව අසලින් පටන් ගෙන සතිපොළ, මහජන ක්‍රීඩාංගනය හරහා පොදු වෙළෙඳ සැල දක්වා ඇති මාර්ගය පූජ්‍යදාස තේනුවර මාවත ලෙස නම්කර ලියාපදිංචි කිරීම.

05ඃ07ඃ02 බුළත්ගම ඇස්ඇද්දුම මාර්ගයේ නගර සභා සීමාවේ අවසාන කොටස ජේ.සී.බී. යන්ත්‍රය යොදා පුළුල් කිරීම.

05ඃ07ඃ03 වැවවත්ත උද්‍යානයේ කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා බුළත්ගම සම්පත් ගොවි සංවිධානය වෙත ලබාදීම.

*ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් අදහස් දක්වමින්* කොමර්ෂල් බැංකුව අසලින් පටන් ගෙන සතිපොළ, මහජන ක්‍රීඩාංගනය හරහා පොදු වෙළෙඳ සැල දක්වා ඇති මාර්ගය පූජ්‍යදාස තේනුවර මාවත ලෙස නම්කර ලියාපදිංචි කිරීම සුදුසු බව පවසා සිටි අවස්ථාවෙ ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සූදානම් කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් පවසා සිටින ලදී.

*මෙහිදී අදහස් දැක්වූ ගරු* නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමන් විසින් මේ සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙකුගේ ලිඛිත අනුමැතිය අවශ්‍ය වන බවට සභාව දැනුවත් කරන ලදී.

*එමෙන්ම තව දුරටත් අදහස් ප්‍රකාශ කල ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා* බුළත්ගම ඇස්ඇද්දුම මාර්ගයේ නගර සභා සීමාවේ 20% පමණ වන අවසාන කොටස ජේ.සී.බී. යන්ත්‍රය යොදා පුළුල් කර දෙන ඉල්ලා සිටි අතර වැවවත්ත උද්‍යානයේ කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා බුළත්ගම සම්පත් ගොවි සංවිධානය වෙත ලබාදීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු සභාපතිතුමා විසින් අනුමත කරන ලදි.එහෙයින් ගරු *නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා සභාවේ ඒකමතිකව සම්මත විය.*

***05ඃ08 ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය***

05ඃ08ඃ01 කිරිඳිගල ජල සම්පාදන මණ්ඩලයට හැරෙන ස්ථානයේ මාර්ගය පිළිසකර කිරීම.

05ඃ08ඃ02 මුගුණමලේ කාණු පද්ධතිය හා මාර්ගය පිලිසකර කිරීම.

05ඃ08ඃ03 බුද්ධ ජයන්ති පාසල අසල පී.එස්.මහතාගේ නිවසට යන මාර්ගයේ කාණු පද්ධතිය පිළිසකර කිරීම

05ඃ08ඃ04 ශෛලතලාරාම මාර්ගයේ කළුවැල්ල කැලේ අතුරු මාර්ගයට වතුර ලබාදීමට නගර සභාවෙන් අයකරන මුදල නිදහස් කිරීම.

ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය ඉහතින් දක්වා ඇති මාර්ග හා කාණු පිළිසකර කිරීමේ කටයුතු කඩිනමින් ඉටුකර ගැනීමට අවශ්‍ය බවද ශෛලතලාරාම මාර්ගයේ කළුවැල්ල කැලේ අතුරු මාර්ගයට වතුර ලබාදීමට නගර සභාවෙන් අයකරන මාර්ග උරහිස පළුදු කිරීම සඳහා ගාස්තු මුදල නිදහස් කර දෙන ලෙසද ඉල්ලා සිටින ලදී. ඒ සඳහා පිලිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා මාර්ග උරහිස පළුදු කිරීම සඳහා ගාස්තු නිදහස් කිරීමට පොදුවේ තීරණයක් ගත් බැවින් ඒ සඳහා සභාවෙන් අයකරන මුදල නිදහස් කිරීමට හැකි බව පවසා සිටින ලදී.එහෙයින් එම යෝජනා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2018.06.01/ 2018.06.18 දින පැවති මුදල් හා කර්මාන්ත කමිටු වාර්තා ගරු සභාවට ඉදිරිපත් කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**07. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| **පුනරාවර්ථන ලැබීම්** | **8,261,792.85** |
| **වෙනත් ලැබීම්** | **1,804,835.64** |
| **මුලු ලැබීම්** | **10,066,628.49** |
| **පුනරාවර්ථන වියදම්** | **8,177,342.64** |
| **වෙනත් වියදම්** | **1,318,325.17** |
| **මුලු වියදම්** | **9,995,667.81** |

**ඉන්ධන වාර්තාව සභාවට ඉදිරිපත් කිරිම.**

2018 -06-01 සිට 2018-06-30 දක්වා

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---|
| 150-0248 | 1,370.00 |
| 226-7521 | 6,540.00 |
| 227-5020 | 38,150.00 |

| | |
|---|---|
| 227-5020 | 770.00 |
| 227-5020 | 930.00 |
| 37-7933 | 21,529.00 |
| 56-1906 | 15,805.00 |
| BC-0005 | 10,900.00 |
| GC 0001 | 15,070.00 |
| GC 0001 | 1,320.00 |
| GK-6227 | 45,460.00 |
| HF-8952 | 6,830.00 |
| LL-2110 | 16,098.00 |
| LL-7688 | 8,720.00 |
| MIXB001 | 1,370.00 |
| ND-5124 | 29,975.00 |
| OV/M0017 | 827.00 |
| PF-4006 | 22,672.00 |
| QL-2901 | 5,945.00 |
| RB-4786 | 17,280.00 |
| RC-1107 | 1,635.00 |
| RC-1118 | 46,870.00 |
| RC-8183 | 5,450.00 |
| RD-8000 | 9,955.00 |
| RD-8240 | 38,615.00 |
| SDRR0013 | 1,010.00 |
| RE-2600 | 30,440.00 |
| UQ-1933 | 1,370.00 |
| VI-1833 | 2,466.00 |
| ZA-0228 | 7,005.00 |
| ZA-5039 | 54,500.00 |
| එකතුව | **465,507.00** |

**08. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා**

- බස් නැවතුම්පොලේ ඉහළ මාලයේ සිවිලිම ඉතා අබලන් තත්ත්වයේ පවතින බවත්, සිවිලිමට යොදා තිබෙන්නේ ශීතකාමර වලට භාවිතා කරන සෘජුෆෝම් වර්ගයක් වන අතර එහි කුඩු හැලීම නිසා හා පරවියන් අපවිත්‍ර කිරීම නිසා විශාල දූර්ගන්ධයකට කඩහිමියන් මුහුණ පා ඇති බවත්, පැවසූ ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මන්ත්‍රීතුමා සභාවේ අවධානය මේ සඳහා යොමු කරන ලෙස පවසා සිටින ලදී.

- බෝම්බුවේ තුන්වන පටුමගේ බැමි යොදා ඇති කොටසට නගර සභා මාර්ගය බාදනයට ලක් වීමේ ඉඩ කඩ පවතින බැවින් ඒ සඳහා පැති බැම්මක අවශ්‍යතාවයක් පවතින බවත්, පෙර දී එහි නිවැසියන්ගේ විරෝධයක් තිබූ නමුදු දැනට ඒ සඳහා විරුද්ධත්වයක් නොදක්වන බැවින් අදාල පැති බැම්ම සකස් කර මාර්ගය බාදනය වීම වලක්වා ගත හැකි බවත්, පවසා සිටින ලදී.

- එමෙන්ම අක්කර 18 ප්‍රදේශයේ අයි. ජී. රෙස්ට් අසලින් පටන් ගන්නා කාණුවක ජලය ගලාගෙන යාමට බාධාකාරි ලෙස පවතින විශාල ගලක් නිසා කාණුවේ ජලය පිටාර යන බැවින් ගල කඩා ඉවත් කර කාණුවට වන හානිය වැළැක්වීමට සභාවේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

- පා පන්දු අවසන් තරග පැවැත්වීමට නියමිත බැවින් නගර සභා ක්‍රීඩාංගනයේ කන්ටේනර් ඇතුලත් කිරීම නිසා සෑදී ඇති විශාල වලවල් දෙක තුන පිළිසකර කර දෙන මෙන් ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා බස් නැවතුම්පොළ සිවිලිම ගලවා පිළිසකර කිරීමට යෝජනා අනුමත වී ඇති බව ගරු සභාවට දන්වා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය .**

- සුදර්ශනගම මාර්ගයට ජලය ලබා ගැනීමේදී නගර සභාව මඟින් ඔප්පුවක් හෝ බලපත්‍රයක් අවශ්‍ය බව ගම්වාසීන් කොටසකට පමණක් දැනුම් දී ඇති බවත්, එම නිසා එම ගම්වාසීන් කොටසකට පමණක් සිදු වූ අසාධාරණය පිළිබඳ විමසා සිටින බවත් පැවසූ ගරු නාගරික මන්ත්‍රීනිය නීතිමය රාමුවකට යන්නේ නම් නීතිය සැමට පොදු විය යුතු බව පවසා සිටින ලදී.

- ගරු සභාපතිතුමා ඒ සඳහා පිළිතුරු සපයමින් එසේ කිසිඳු අසාධාරණයක් වී නැති බවත්, වැරදි මතයක් ප්‍රචාරණය වී ඇති බවත්, පවසා සිටින ලදී.

- තවදුරටත් අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රීවරිය සුදර්ශනගම කසල එකතු කිරීම සඳහා නගර සභා ට්‍රැක්ටරය යා නොහැකි බව පවසන නමුත් නොදිරන අපද්‍රව්‍ය එකතු කරන ට්‍රැක්ටරය එම මාර්ගයේ ගමන් කරන බවත්, එම නිසා කසල ට්‍රැක්ටරය ද එම මාර්ගයේ ගමන් කළ හැකි බව ගම් වාසීන් පවසන බව ගරු සභාවට දන්වා සිටින අතර ට්‍රැක්ටරය යා නොහැකි නම් ඒ සඳහා විකල්පයක් ලබා දෙන මෙන් ඉල්ලීමක් කරන ලදී

<u>*ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා*</u>

- මාර්ග උරහිස පළුදු කිරීමේ ගාස්තු නිදහස් කරන්නේ නම් කිසිඳු බේදයක් නොකර පොදුවේ ගාස්තු නිදහස් කරන ලෙස ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් මෙහිදී ඉල්ලා සිටි අතර, නගර සභාව මඟින් ලබා දෙන අනුකූලතා සහතිකය ලබා ගැනීමේදී මහජනයා විශාල වශයෙන් අපහසුතාවයට පත් වන ක්‍රමවේදයක් පවතින බැවින් ඒ සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර දෙන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.

- ඒ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පෙර සභාපතිට ලබා දී තිබූ නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිගේ බලතල නැවත ඔවුන් විසින් පවරාගෙන ඇති බැවින් ඒ පිළිබඳ කටයුතු කිරීම සඳහා නැවත එම බලතල පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බව පෙන්වා දෙන ලදී.

<u>**ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය**</u>

- මෙහිදී අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය, එක්තරා හෝටලයක් විසින් හෝටලයේ සියළු අපද්‍රව්‍ය කාණුවට හරවා ගමම ගඳ ගස්සවන වැඩපිළිවෙළක් සිදු කර තිබුන අතර ගරු සභාපතිතුමා හා නිළධාරි මණ්ඩලය එම තත්වය වැළැක්වීමට ගත් පියවර පිළිබඳ ස්තුතිවන්ත වන බව පැවසූ අතර එවැනිම තවත් ගැටළුවක් උද්ගත වී ඇති බවත් කරව්කැටිය ප්‍රදේශයේ ස්ථානයක බල්ලන් හා ගවයන් බොහෝ ලෙස ඇති කරන අතර එම සතුන්ගේ අසූචි කාණු වලට බැහැර කිරීම නිසා ඉතා අපවිත්‍ර හා දුර්ගන්ධයක් ඇති වී ඇති බැවින් මහජන පීඩාකාරි තත්වයක් උද්ගත වී ඇති බැවින් ඒ සඳහා සභාවේ අවධානය යොමු කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.

- අළුතෙන් වීදි ලාම්පු යෙදීමට අත්‍යාවශ්‍ය ප්‍රදේශ කිහිපයක් පවතින බවත්, ඒ සඳහා සභාවේ අවධානය යොමු කරන ලෙස ගරු නාගරික මන්ත්‍රීනි ඉල්ලා සිටි අතර ඒ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා අදාල නිළධාරින් ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන බව පවසා සිටින ලදී.

<u>**ගරු නාගරික මන්ත්‍රු එම්. ඩබ්. විමලසිරි මැතිතුමා**</u>

- උඩකන්ද ගල්වල මාර්ගයේ අළුතින් එක් වූ කොටසක වරිපනම් අය කරන නමුත් කසල එකතු කිරීම සිදු නොවන බවද, වතුකාරගොඩ ගමේ හා බලංගොඩ කෙළවර පන්සල වත්ත මාර්ගයේ තත්ත්වයද එසේම බව ගරු සභාවට පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා මෙම මාර්ග වල ඕනෑම වාහනයක් ධාවනය කිරීමට හැකි බවත් මෙම ගම්වාසීන්ගේ කසල ප්‍රශ්නය පිළිබඳව ගරු සභාවේ කාරුණික අවධානය යොමු කරන ලෙසත්, ඉල්ලා සිටින ලදී

<u>**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**</u>

- කරදියමුල්ල මාර්ගයේ කාපට් අතුරා නැති කොටස ඉතා අබලන් තත්ත්වයේ පවතින බැවින් එහි ගමන් කරන වාහන පවා අබලන් තත්ත්වයට පත්වීමේ අවධානමක් උද්ගත වී ඇති බවත් පාසල්

ළමුන්ට පවා ජල වලවල් නිසා මාර්ගයේ ගමන් කළ නොහැකි බැවින් අදාළ කොන්ත්‍රාත්කරු මේ පිළිබඳ දැනුවත් කරන ලෙස ඉල්ලා සිටින ලදි.

- එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් රෝහල් කාණුව නිසා වළවේ ගඟ අපවිත්‍ර වී ඇති බැවින් එම තත්ත්වය වැළැක්වීම සඳහා ගරු සභාවේ අවධානය යොමු කරන ලෙසද ඉල්ලා සිටින ලදි.

- ඒ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් එම කටයුතු සොයා බැලීම සඳහා වේලාවක් වෙන් කර ගෙන දැනුම් දෙන ලෙසත් ඊට සහභාගී වීමට හැකි බවත් ප්‍රකාශ කර සිටින ලදි.

**<u>ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා</u>**

- මෙයට පෙර මහ සභා වාර 03 කදී සාකච්ඡා කළ පරිදි කිරිඳිගල වැලිහරනාව වට රවුම් පාර ඉතා අබලන් තත්ත්වයේ පවතින බවත්, ගම්වාසීන් විසින් මේ පිළිබඳ වසර ගණනාවක සිට ඉල්ලීම් කළද කිසිදු සංවර්ධනයක් සිදුනොවූ බවත් ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් පවසා සිටින ලදි.

  ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන්කර පසු මාසයක් ඇතුළත එහි සංවර්ධන කටයුතු සිදුකිරීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමන් විසින් දන්වන ලදි.

- ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් නැවතත් අදහස් දක්වමින් පදික කඩ හිමියන් ඉතා අසරණ තත්ත්වයකට පත්වී ඇති බැවින් ඔවුනට ඉතා කඩිනමින් විකල්පයක් ලබාදෙන මෙන් ඉල්ලා සිටි අවස්ථාවේදී ඒ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් ඉතා කඩිනමින් එහි වැඩකටයුතු ආරම්භ කිරීමට නියමිත බව දන්වා සිටින ලදි.

**<u>ගරු නාගරික මන්ත්‍රිනි ශාන්තිලේඛා මැතිතුමිය</u>**

- ගරු නාගරික මන්ත්‍රිනි ශාන්තිලේඛා මැතිතුමිය විසින් අදහස් දක්වමින් පසුගිය සභා වාරයේදී පැවසූ පරිදි නගර සභා සභිකයන් සඳහා සාමදාන විනිශ්චයකාර තනතුර ලැබීම පිළිබඳ අදාළ නිලධරයන්ගෙන් විමසා සිටි අතර ඔවුන් විසින් නෛතික ප්‍රතිපාදන පෙන්වීමට අවශ්‍ය නම් දිවුරුම් දීම අවශ්‍ය බවත් දැනුම් දී ඇති බව ගරු සභාවට ප්‍රකාශ කරන ලදි.

  එහිදී ගරු සභාපතිතුමන් විසින් නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව ඒ සඳහා බලතල ලැබී ඇති බවත් තව දුරටත් ඒ සඳහා කරුණු දැනගැනීමට කටයුතු කරන බවත් දන්වා සිටින ලදි.

- ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් අදහස් දක්වමින් නගර සභා සභිකයන් පත්වූ ගැසට් පත්‍රය හා සභික හැඳුනුම්පත ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස ඉල්ලා සිටින ලදි.

## 09. අවසානය

- අද දින සභාව අඩුපාඩු මධ්‍යයේ වුවත් ක්‍රමවත්ව පවත්වාගෙන යාමට හැකිවූ බවත්, බස්නැවතුම්පළ සිවිලිම සම්පූර්ණයෙන් ගලවා ඉවත්කර සෝදා පවිත්‍ර කිරීමට බලාපොරොත්තු වන බවත් ඊට අවශ්‍ය සහාය සිංහ සමාජයෙන් ලබාදෙන ලෙසත් ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කර සිටින ලදි.

- එමෙන්ම නගරයේ පොළ භූමිය වැනි පොදු ස්ථාන මුදල් යොදා ක්‍රමවත් පරිදි සංවර්ධන ව්‍යාපෘති සිදු නොකිරීම නිසා දෛනිකව ලබාගත හැකි ආදායම් නැතිවී සතියකට පමණක් ආදායම් උත්පාදන මාර්ග බවට පත්ව ඇති බවත් ඉදිරියේදී ගරු සභිකයන්ගේ අදහස් හා යෝජනා ලබාගෙන දෛනිකව සභාවට ආදායම් ලැබෙන පරිදි සංවර්ධන ව්‍යාපෘති බවට පත් කිරීමටත් අපේක්ෂා කරන බව දන්වා සිටින ලදි. එසේම ගරු සභාපතිතුමන් විසින් මෙදින වැඩකටයුතු ක්‍රමවත්ව කරගෙන යාමට සහාය දක්වූ සැමට ස්තුතිය පළ කරමින් ගරු සභාපතිතුමන් විසින් ප.ව. 1.00 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදි.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.